# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 2302/16 - 2022 ඔක්තෝබර් මස 18 වැනි අඟහරුවාදා - 2022.10.18

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# III වැනි කොටස - ඉඩම්

## ඉඩම් රජයට ගැනීම පිළිබඳ දැන්වීම්

**ඉඩම් අත්කර ගැනීමේ පනත (460 වැනි පරිච්ඡේදය)**

7 වැනි වගන්තිය යටතේ දැන්වීම

*මගේ අංකය* : ATU/LND/04/DO55.
*ඉඩම් අමාත්‍යාංශයේ අංකය*: 4-3/5/2019/HA625.

මහජන කටයුත්තක් සඳහා අවශ්‍ය පහත දැක්වෙන ඉඩම ලබා ගැනීමට රජය අදහස් කරන බැව්, ඉඩම් අත්කර ගැනීමේ පනතේ 7 වැනි වගන්තියේ (1) වැනි උපවගන්තිය යටතේ මෙයින් දැනුම් දී සිටිමි.

*ලබාගැනීමට බලාපොරොත්තු වන ඉඩමේ විස්තර:*

මාතර දිස්ත්‍රික්කයේ, අතුරලිය ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, වේනගම ග්‍රාම නිලධාරි වසමේ වැලිහේන ගමේ පිහිටි, මාතර සර්වේ ජනරාල්ගේ කැලෑ මැනුම් මූලික පිඹුරු අංක මාර 83 හි පෙන්නුම් කරන පහත දැක්වෙන ඉඩම:

**කැබලි අංකය 487**

ඉඩමේ නම: වැලිහේනේ කැළය; ඉඩමේ විස්තරය: ගෙවත්ත, ස්ථිර ගොඩනැගිල්ලක් ඇත; හිමිකම් කියන අය: මාතර ගමගේ හේමපාල මයා, අංක 27, ජයවර්ධන පුර, පෝරතොට, ගොඩපිටිය; ප්‍රමාණය: හෙක්ටයාර් 0.0123.

ඉහත සඳහන් ඉඩමට /පරවශතාවයට හිමිකම් අයිතිවාසිකම් කියා සිටින සියලු දෙනාම තම තමන් හෝ ඔවුන්ගේ ලියවිලිවලින් බලයලත් අයවලුන් හෝ 2022 නොවැම්බර් මස 21 දින පෙ.ව. 10.00ට අතුරලිය ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ දී මා සම්මුඛ විය යුතුය.

තව ද, 2022.11.14 දිනට මත්තෙන් ඒ ඉඩම/ඉඩම් සම්බන්ධයෙන් ඔවුන්ගේ අයිතිවාසිකම්වල ස්වභාවයත් එකී ඉඩම්/පරවශතාවය ලබාගැනීම ගැන වන්දි ඉල්ලීමට ඇති කරුණු පිළිබඳ විස්තරත්, වන්දි මුදල හා ඒ මුදල ගණන් බැලූ හැටිත් මා වෙත පිටපත් දෙකක් සහිත වූ ලියවිල්ලකින් දැනුම් දිය යුතුය. අයිතිවාසිකම් තහවුරු කිරීමට ඇති සියළු ඔප්පු තිරප්පු හා වෙනත් ලියවිලි විභාගයට ඉදිරිපත් කළ යුතුය.

**නිරෝෂා එස්. ගමගේ,**
ප්‍රාදේශීය ලේකම්,
අතුරලිය.

2022 ඔක්තෝබර් මස 10 වැනි දින,
අතුරලිය ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ දී ය.

EOG 10 - 0122